

# තුංමංහංදිය නවකතාව හා තුංමංහංදිය සිනමා කෘතිය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්.

(සාහිත්‍යය සිනමාවට නැගීම පිළිබඳ විශේෂ අවධානය සහිත ව)

# ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී භාෂා (විශේෂවේදී) අවසාන උපාධි පරීක්ෂණය සඳහා නියමිත ස්වාධීන නිබන්ධය.

ප්‍රධාන විෂය : සිංහල

අධ්‍යයන වර්ෂය : 2000/2001

විභාග අංකය : EA 1026

ලියාපදිංචි අංකය : 00/SL/019

භාෂා අධ්‍යයනාංශය,
සමාජීය විද්‍යා හා භාෂා පීඨය,
ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය,
බෙලිහුල්ඔය,

# තුංමංහංදිය නවකතාව හා තුංමංහංදිය සිනමා කෘතිය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්.

(සාහිත්‍යය සිනමාවට නැඟීම පිළිබඳ විශේෂ අවධානය සහිත ව)

-2004-

BA project assessment
This report has been awarded the grade
A (B) C D
Department of Languages
Sabaragamuwa University of Sri Lanka
10/02/2005

## කර්තෘගේ ප්‍රකාශය

මා විසින් හෝ වෙනත් පුද්ගලයකු විසින් මෙම නිබන්ධය වෙනත් කිසිම පාඨමාලාවක් සඳහා ඉදිරිපත් කර නැති බවත් මෙම නිබන්ධය පිළියෙල කිරීමේදී මා විසින් ලබා ගන්නා ලද සෑම අන්දමකම උපකාරයන් හා ආධාරයන් ද පරිහරණය කරන ලද ග්‍රන්ථ, ලිපි ද්‍රව්‍ය හා වෙනත් මූලාශ්‍ර සියල්ලක් ම ද මෙහි දක්වාඇති බව සහතික වෙමි.

28/05/2004

දිනය

කර්තෘගේ අත්සන

ශාස්ත්‍රවේදී භාෂා (විශේෂවේදී) උපාධිය සඳහා වන අධ්‍යාපනික අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද බව සහතික කරමි.

---------------------

දිනය

-------------------------

අධ්‍යනාංශාධිපති

# පිදුම

සුදොවුන් පරපුරේ -
පියවරුන්ටත්,

මහාමායා පරපුරේ -
මව්වරුන්ටත්,

දිසාපාමොක් පරපුරේ -
ඇදුරන්ටත්,

පුදමි මේ ගත ගරුසිත් යුතුව...

# කෘතවේදී ආවර්ජනය

ගව්ගණන් දුරසිටියත් කසාවත දරාගෙන නිරතුරුව ම මට ආශිර්වාද කරන ධම්මිස්සර පොඩි හාමුදුරුවන්වත් රූපා සිල්මාතාවත් සිහිකරන්නේ හද බැතියෙනි.

"සිංහල" උපාධියක් කළ අයෙකුට තම කනිටු දියණිය විවාහකර දීමට තරම් එඩිතර වූ, උපාධිය සඳහා ප්‍රධාන විෂය වශයෙන් "සිංහල" තෝරා ගැනීමට තදින් ම මා දිරිමත් කර, ප්‍රාණවායුව ආකාශ වායුවට මුහුකරමින් සදහට ම මගෙන් සමුගෙන ගිය ආදරණීය මාමාණ්ඩී පී. මුණසිංහ පියාණන්ට පිං පඬුරු පුදමි.

සරසවියට පැමිණි මට "සිංහල" පිළිබඳ පළමු දේශනයත් ඔහුගෙනි. තෙවසරකට පමණ පසු ව සකසන ස්වාධීන නිබන්ධයේ උපදේශකවරයා ද ඔහු ය. තොටමුණ කරා සළුලදායී ලෙස මා කැඳවාගෙන යාමට හැකි සෑම අයුරින් ම උපකාර කළ හිනිදුම සුනිල් සෙනෙවි නම් වූ ගුරුපියාණන්ට ද කෘතගුණවේදී වෙමි.

නිල වාදයට වඩා සදාචාර වාදය ක්‍රියාවේ නංවන, භාෂා අධ්‍යයන අංශයේ අංශාධිපති මනෝජ් ආරියරත්න ගුරුපියාණන්ට ද,

සරසවි දිවියේ දී මා හට හොඳ හැටි සිප්කිරි පොවා මා පෝෂණය කළ ප්‍රියංකා වීරසේකර, චම්පා ද සිල්වා,අරුණි එස්.පෙරේරා යන ගුරුමෑණිවරුන්ට ද කෘතගුණවේදී වෙමි.

සම්මත වාදයන්ට වහලෙකු නොවී ලොව දකින්නට මට හුරු කළ මහින්ද පතිරණ ගුරු පියාණන්ට ද,

ලසන්ත ජයසුන්දර, ලයනල් ගුණරත්න ආදී වූ අතීතය සුවඳවත් කළ ඇදුරු පරපුර සිහිකරන්නේ ගෞරවයෙනි.

නිබන්ධය සඳහා අවශ්‍ය තොරතුරු සපයාගැනීමේ දී මට විවිධ අයුරින් උපකාර කළ සැම දෙනාත් ආදරයෙන් සිහිපත් කරමි.

මාගේ පරපුරේ මුල් පුරුක මගේ අම්මා ය. තාත්තා ය. සම්මත පරපුරෙන් ඔවුන් වෙන් කළ එක ම සාධකය රුපියල් සත ය. රුපියල් සත හමුවේ ඔවුන් හෙළූ කඳුල මාගේ පරපුරේ ආරම්භය විය. සම්මත පරපුරේ කිසිවෙකුත් නොලද වරම "දෙහි ගැට පියසේන" නමින් විරුදාවලි ලැබූ පියාගේ පරපුරේ දෙවැනි පුරුක වන මම ලදිමි. මා සරසවියට තේරී පත් වූ දා මෙලොව වඩාත් තුටු කඳුළු හෙළූ ඈ මාගේ අම්මා ය. උපාධි ලෝගුව ගත පැළඳ මා එනතුරු මහ ගෙදර ඇති වූ පාළුව ඇය උහුලා ඉන්නේ කඳුළු වසාගත් අභිමානයෙනි. උපාධිධාරී පුතා ගෙදර එනතුරු මග බලාහිඳින අම්මේ, තාත්තේ, මේ විරුදාවලිය මට ලැබෙනතුරු ඔබ විඳි වේදනාවන්ට මහත් පිං.

වැදූ අම්මාගේ සෙනෙහසට නොදෙවෙනි හැදූ අම්මාවරුන් තිදෙනෙකු මා සතු වීම මෙලොව මා ලද උතුම් ම පැසසුමකි. මාගේ ජීවිත ගමන සවිමත් කිරීමට ලොකු අක්කාත්, ගීතාක්කාත්, සුදුහාමිනේ අක්කාත් කරන අපමණ කැපකිරීම් ගැන සිහිකරන්නේ සෙනෙහසිනි. ඔවුන්ගෙන් ලැබෙන සහයෝගය තවදුරටත් තියුණු කිරීමට උත්තේජක වන් රංජන් අයියාත්, රළහාමි අයියාත්, ලොකු අයියාත් පුණ්‍යලාභියෝ වෙත්.

කඩදාසිය මත තබන අත්සන ගැන කිසිවිටෙකත් නොසිතා පවුලේ උණුහුම බෙදා දෙන ශ්‍රීමා මුණසිංහ මැණියන්වත්, සවිත්‍රී අක්කාවත්, ග්‍රෙහම් අයියාවත් සිහිපත් කරන්නේ සෙනෙහසිනි.

ඇතිදාට වඩා නැතිදාට අප ළඟින් සිටින ජේ.ආර්. ජයවර්ධන (වේයන්ගොඩ මාමා) ප්‍රමුඛ නව ඥාති පරපුරේ සැමත් ගරු සිතින් සිහිපත් කරමි.

අපිළිවෙල අත්අකුරු හුරුබුහුටි පරිගණක අක්ෂර බවට පත් කිරීමට වෙහෙස වූ චම්පිකා සීතා අක්කාටත් රේණුකා, මධුෂානි නංගිලාත් ආදරයෙන් සිහිපත් කරමි.

උපසංස්කෘතියට අනුව කනිට්ඨ සොයුරෙකු වුවත් සමීප මිතුරෙකු වන අමිත් ජයවර්ධන මල්ලිටත් හෙළබස ඉගෙනුමට සරසවියේ දී උරෙනුර ගැටී කටයුතු කළ විපුල කුමාර සෙයුරාටත් තරුණ ජීවිතයේ දී ඇති වූ බොහෝ ගැටළු හමුවේ තරුණ විසඳුම් ලබා දුන් සහෘද මිතුරු කැළ ද ආදරයෙන් සිහිපත් කරමි.

සරසවි දිවියේ දී හඳුනාගෙන මතුදිවිය සඳහා ආත්මීය සටහනක් තැබූ ගයත්‍රි ව ද ආදරයෙන් සිහිපත් කරමි.

## පූර්විකාව

සිනමා කෘතියක් නිර්මාණය කිරීමට අදහස් කරන නිර්මාණකරුවකුට සාහිත්‍යය හොඳ මූලාශ්‍රයක් වේ. සාහිත්‍ය කෘති අතරින් නිර්මාණය වූ සිනමා කෘති බොහොමයක් දැකියහැකි වුවත් සාහිත්‍ය කෘතියේ කර්තෘ සහා සිනමා කෘතියේ අධ්‍යක්ෂක, තිරවක යන පදවි සියල්ල එක ම පුද්ගලයකුට හිමි වූ අවස්ථා ලෝක සිනමාවේ පවා විරල ය. එවන් විරල වූ සටහනක් සිංහල සිනමා වංශකතාවේ මුල් වරට සනිටුහන් කළේ මහගම සේකර ය. තම ජීවිතයේ කුළුදුල් මෙන් ම එක ම සිනමා ගෙත්තම බවට තුංමංහංදිය දෛවෝපගත විය.

සිනමා කෘති පිළිබඳවත් සාහිත්‍ය කෘති පිළිබඳවත් කොතෙකුත් ලිපි ලේඛන පළ වී ඇතැත් සාහිත්‍ය කෘති ඇසුරින් කරනලද සිනමා කෘති පිළිබඳ ව සංසංධතාත්මක අධ්‍යනයන් කර හෙළ බසින් ලියවුණු කෘති ඇත්තේ අල්ප වශයෙනි.

ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා සිංහල විෂය ප්‍රධාන විෂය වශයෙන් තෝරාගත් මට ස්වාධීන නිබන්ධය සඳහා අදාළ මාතෘකාව එහි විෂය පථයෙන් ම තෝරා ගැනීම ට සිදු විණි. එබැවින් සාහිත්‍යය සිනමවට නැඟීම යන ශිර්ෂය යටතේ තුංමංහංදිය නවකතාව හා සිනමා කෘතිය මාගේ අධ්‍යයනයට තෝරා ගත්තෙමි. මෙම කෘතිය එහි ප්‍රතිඵලයයි.

අප විශ්වවිද්‍යාලයේ පවතින අධිවාර්ෂික අධ්‍යයන ක්‍රමය අනුව එක් අධි වාර්ෂිකයක් සඳහා සති 15 ක් වැනි ඉතාම කෙටි කාලයක් වලංගු විය. මෙම කාලය තුළදි තවත් ප්‍රශ්නපත්‍ර 4 කට සූදානම් වන අතරතුර මෙම අධ්‍යයනය කිරීමට සිදුවීම බොහෝ ගැටළු සහගත විය. නමුත් හැකි සෑම ප්‍රයත්නයක් ම ගෙන අධ්‍යයනය වඩාත් ඵලදායි ලෙස සිදු කිරීමට

වෙරදරුවෙමි. මෙම නිබන්ධය එක් ප්‍රශ්න පත්‍රයක් සේ සැලකිම අධ්‍යන නිදහස සීමා කරන්නක් විය.

තුංමංහංදිය චිත්‍රපටය තිරගත වූයේ 1970 දී ය. පැරණි සිංහල චිත්‍රපට සංරක්ෂණය කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් නොමැති බැවින් වසර 33 කට පසු ව එම චිත්‍රපටයේ පිටපතක් සොයා ගැනීමේ දුෂ්කරතාවක් ද මතු විය. නමුත් වෙහෙස වී හෝ පිටපතක් සොයාගැනීමට හැකි වුවත් එය රූපවාහිනි නාලිකාවක විකාශනය කරන ලද අවස්ථාවක දී පිටපත් කර ගන්නා ලද පිටපතක් බැවින් එහි ගුණාත්මක භාවය පිළිබඳ ගැටළුවක් මතු විය.

සිනමා කෘතියක් රිදී තිරයේ දිවෙන විට රසවිඳීමත් පුංචි තිරයේ දිවෙන විට රසවිඳීමත් අතර බොහෝ වෙනස්කම් ඇති වේ. අධ්‍යයනය කරන සිනමා කෘතිය රිදී තිරයේ බැලීමට තරම් වූ අවස්ථාවක් නොමැති බැවින් වීඩියෝපට ධාවන යන්ත්‍රයක් (Deck) භාවිතයෙන් පිටපතක් නරඹමින් අධ්‍යයනය කිරීමට සිදුවීම ද දුෂ්කර කාර්යයක් විය. සිනමා කෘතියත් නවකතාවත් තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට නම් එම මූලාශ්‍රයන් දෙක නිතර ම සසඳමින් නිදහසේ අධ්‍යයනය කළ යුතු නමුත් සබරගමු විශ්වවිද්‍යාලයේ ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම ද දුෂ්කර කාර්යක් විය.

අගනු වරට කිලෝමීටර්160 කටත් එපිට සිටිමින් අධ්‍යයන කටයුතු කිරීමට සිදු වීම නිසා සම්පත් දායකයින් සම්බන්ධ කර ගැනිමෙහි දී ද බොහෝ අපහසුතා ඇතිවිය.

දත්ත ලබා ගැනීම සඳහා හැකි සෑම අවස්ථාවක දී ම ප්‍රාථමික මූලාශ්‍රය කරා ගමන්කිරීමට උත්සහ කළ ද ප්‍රයෝගික ව මතු වූ ගැටළු හමුවේ ද්විතීක මූලාශ්‍රය කෙරෙහි විශ්වාසය තැබීමට සිදුවිය. සමහර අවස්ථාවන් හි දී ද්විතීක මූලාශ්‍රයවල ඇතළත් යම් යම් කරුණුවල දක්නට ලැබුණු පරස්පරතා නිසා වඩාත් විශ්වසනීය තොරතුරු ඇති බවට

තීරණය කළ හැකි කෘති තෝරා ඒ ඇසුරින් නිගමන කරා එළඹීමට සිදු විය.

මෙම නිබන්ධයේ ඇතුළත් එක් පරිච්ඡේදයක් මහගම සේකර, තුංමංහංදිය නවකතාව හා සිනමා කෘතිය යන මෘතුකාව යටතේ වේ. එහිදී මහගම සේකර පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතුළත් කර ඇත. මෙය ශාස්ත්‍රීය නිබන්ධයක දී එතරම් දුරට අවැසි දෙයක් නොවූවත් මගේ අධ්‍යයනයට ලක්වන තුංමංහංදිය නවකතාව හා සිනමා කෘතිය මහගම සේකරගේ පෞද්ගලික ජීවිතයේ සමීප අත්දැකීම් හා බැදෙන නිසා මහගම සේකරගේ පෞද්ගලික ජීවිතයේ තොරතුරු බොහොමයක් මෙයට අන්තර් ගත කළෙමි.

උක්ත කරුණු නිසා සාහිත්‍යය හා සිනමාව පිළිබඳ අධ්‍යයනය කරන්නවුන්ටත්, මහගම සේකර පිළිබඳ අධ්‍යයනය කරන්නවුන්ටත් මාගේ මෙම අධ්‍යයනය බෙහෙවින් ම එලදායී වේ යැයි මම සිතමි.

# පටුන

පිදුම iii

කෘතවේදී ආවර්ජනය iv

පූර්විකාව vii

පටුන x

**පළමුවැනි පරිච්ඡේදය**

1.1 සාහිත්‍යය 1

1.2 සිනමාව 3

**දෙවැනි පරිච්ඡේදය**

2.1 සිංහල සිනමාවට නැගුණු කෙටිකතා 9

2.2 සිංහල සිනමාවට නැගුණු නවකතා. 14

**තුන්වැනි පරිච්ඡේදය**

3.1 මහගම සේකර 23

3.2 තුංමංහංදිය නවකතාව 35

3.3. තුංමංහංදිය සිනමා කෘතිය 38

## සිව්වැනි පරිච්ඡේදය

භාෂාත්මක කථනය හා රූපාත්මක කථනය 45

## පස්වැනි පරිච්ඡේදය

කුංමංහංදිය නවකතාව සිනමාකරණය වීමේ දී වෙනස් වී ඇති අයුරු

5.1 නවකතාවෙන් ඉවත්වූ දෑ 59

5.2 චිත්‍රපටයට අලුතින් එක් වූ දෑ 61

## සහවැනි පරිච්ඡේදය

මුල් කෘතියට හානියක් සිදු වී ද? 66

## සත්වැනි පරිච්ඡේදය

සමාලෝචනය 70

ආශ්‍රිත ග්‍රන්ථ 73

උප ග්‍රන්ථය